# පුරාණ හිමගත වර්ණනාව

හෙවත්

# ශ්‍රීපාද වන්දනා ගමන



# පුරාණ හිමගත වර්ණනාව

- හෙවත් -

# ශ්‍රී පාද වන්දනා ගමන.

1. ස ව න | දහම් සඟ රත්නය | වැඳලා
සු ම න | සුරිඳු සහ සැම දෙවි | යැදලා
සු ගු න | දෙමව් පිය ගුරුවර | වැඳලා
බැති න | කියමි හිමගත මග | ලකලා

2. සරණයි | සරණයි බුද්ධං | සරණයි
සරණයි | සරණයි ධම්මං | සරණයි
සරණයි | සරණයි සංඝං | සරණයි
සරණයි | සරණයි මේ තුන් | සරණයි

3. බු ද් ධ ං | සරණෝ පළමු | වඳින්නෙමි
ධ ම් ම ං | සරණෝ දෙවනු | වඳින්නෙමි
ස ං ඝ ං | සරණෝ තෙවනු | වඳින්නෙමි
මෙම තුන් | සරණෝ නිතර | වඳින්නෙමි

4. න ම ස් | කාර ගාථාව කියා | ලා
ස තො ස් | සිතින් පන්සීලෙ ලබා | ලා
නො ල ස් | ව සැම දෙවිඳුට පින් දී | ලා
ය ස ස් | එසිරිපා වඳිමුව මෙක | ලා

5. බු ද් ධ ං | සරණෝ සිරසට | මංගල
ධ ම් ම ං | සරණෝ ලැමදට | මංගල
ස ං ඝ ං | සරණෝ දෙවුරට | මංගල
මේ තු න් | සරණෝ සැමටම | මංගල

6. බු ද් ධ ං | සරණෝ සිරසට | සීමා
ධ ම් ම ං | සරණෝ ලැමදට | සීමා
ස ං ඝ ං | සරණෝ දෙවුරට | සීමා
මේ තු න් | සරණෝ සැමටම | සීමා

7. සමන් දෙවිඳු හට පින් දුන් මංගල
විෂ්ණු දෙවිඳු හට පින් දුන් මංගල
දෙවොල් දෙවිඳු හට පින් දුන් මංගල
සිරසෙ දරමි අපි සැම දෙවි මංගල

8. සාසන බාරවූ විෂ්ණු දෙවිය නේ
මේ හිම බාරවූ සමන් දෙවිය නේ
දෙසක් තිබුන මුත් දුරලා හරි නේ
වඳින්ට යන්නට අවසර ලැබෙ නේ

9. ගෙ ත් ත න් පානට මුණි රජ වැඩ ලා
තෙ ලි ස න් දිවිසන් ආසන කර ලා
ඉ ඳි ක ටු නුළුත් ගෙන සපයා ලා
ගෙ ත් ත න් කර මුනි රජ පිටිපා ලා

10. අහස මේග වැසි වතුර ගලා ගෙ ණ
බිත කරණ ගල් පහුරක් පැදග ණ
වාත සුළං සෙල් කඳු ගුගුරා ගෙ ණ
වසවතු එයි තද මේග මවාග ණ

11. මඳකුත් ඌ දෙස නොබලා වැඩ ඉ ඳ
ඉදිකටුවෙන් ආසන වට ඉර ඇ ඳ
මුනිඳුගෙ අනුහස් බුදුරැස් පෑ තෙ ද
මුනි දැහැමෙන් ආසනයේ වැඩ ඉ ඳ

12. ධ ම් රාජ ගල් පොත්තට වැඩ ලා
ධ ම් අලංක්‍රීතිය පෙන්නා ලා
ක ම් කොලෝවත් එතනට වැඩ ලා
පෙ මි පැපු ගල් පඩි කප්පා ලා

13. ධම් රජානන් යස පර සි ද්ද
සේරු ඇතුව බිජු වපුල කෙතෙ ද්ද
බොරුව නොවෙයි මොක් සසර ගෙව ද්ද
ධම්රාජ ගල පසුකර යෙ ද්ද

14. තෙලෙහින්නේ ගල්පොත්තට වැඩ ලා
මඳක් එතන සිටගන විමසා ලා
සවුල් අතින් ගෙණ මුල් උදුරා ලා
මඩම කරන ලෙස බිත් බලවා ලා

15. ක ප් පා කළුගල් ටැම් සිටුවා ලා
හ ස් සා නා දැව වට අන්ද ලා
ක ප් පා පේකඩකුත් තිබ්බා ලා
ක ප් පා උළුකැට උඩ සොයවා ලා

16. බෝ වා දහස් කල් පවතින නා මේ
ගා වා වැඩ සිට කළ අප නා මේ
ක ර වා මඩුවක් එකදා නා මේ
පු ර වා වැඩියයි මුනි සිත ඒ මේ

17. ඇ ත සිටම එන පැන් ගඟුලැ ල්ලා
පා ද එබූ මුනිඳුගෙ දෙපතු ල්ලා
දැ ත ම දික්කර කරගල අ ල්ලා
සී ත ගඟුලෙ නා සීතල අ ල්ලා

18. නා නු මුරත් කර සිරස නමා යේ
නා නු සළුත් ඇඳ සිළුත් වඩා යේ
ගා නා පිරි බඩ කොසොන් පුරා යේ
මු නි රජ වැඩියයි දහන් පුරා යේ

19. පෙ ර සිට කළ පින් මතු බව දැනග න
නි ර යට නොගොසින් නිවන් පතා ග න
පු ර වැසියන්ඩත් පින් පුරවා ගෙ න
සැ ර මිටි පානත් නම් පවසා ගෙ න

20. සැ ල් ලේ සේ සිට කියවන බණෝ කී
න ල් ලේ කියවන අතුකොළ සැලෙ කී
සි සි ලේ පවතින බොන පැන් දොල කී
මැ ල් ලේ මල කඳුරෙයි යන නමෙ කී

21. තෘෂ්ණා වසවතු කළ දෙය නොපන ත්
ඇසල කනුව සිටුවාපිය මගට ත්
දැක ලිය දිවයින් මුනිරජ යහප ත්
ලියවූ පත්වෙයි එන කල්පයට ත්

22. පතලන සේ කොත මුදුනට වැඩ ලා
ඇතිවන සේ බුදුගුණ පවසා ලා
කොත පිට මළුවේ සක්මන් පා ලා
කොත පිට වැඩි සිරි පතුල ඔබා ලා

23. අහසින් ගිය පිරිවර පෙන්නා පී
බිම ගිය පිරිවර වට පෙන්නා පී
වසවතු ඇවිදින් මේග මවා පී
එබූ පතුල ගලපිට පෙරලා පී

24. මුනිඳුගෙ අනුසස් අනසක බෝ වේ
පවතින ලෙස සොඳ දිවස් බැළු වේ
ගුවණේ වැඩ සිට සක්මන් පෑ වේ
පෙරළූ ගල පිට පතුල එබූ වේ

25. ල කෂ ගණන් බුදුගුණ විමසා ලා
ල කෂ ණ ඇති සිරි පතුල ඔබා ලා
ස ක් රජ දෙවිඳුට දෙස් පෙන්නා ලා
ම ක් කම වැඩියයි ලක පෙන්නා ලා

26. සතර වරන් දෙව් දිවස් බැළු යේ
සුරිඳු සමන්කුටෙන් බැසලා යේ
මුනිඳු එබූ සිරිපා දැකලා යේ
රන්වැට මිණි පහනුත් ඇවුලා යේ

27. මල්වතු වැද්ද උයන් බල න්නේ
කැකුළු පිපුණු මල් නෙලා තිබෙ න්නේ
කොතැනක සොරුදැයි මෙමල් නෙල න්නේ
සොරා නෙලන මල් වෙද පවස න්නේ

28. ජඩයා කුමටද බොරු තෙපල න්නේ
කවුද තොපගෙ මල් සොරා නෙල න්නේ
රුකවල් ඇවිදින් මෙතන කිය න්නේ
රුකවල් ලා සිට අල්ලා ග න්නේ

29. මල්වතු වැද්ද එබස් අසා ලා
පෙරයම සිට මල් වතුවට රුක ලා
සොරු නෙලනා මල් දැක අල්ලා ලා
කවුරු කොතන අය සොරුදැයි තෙප ලා

30. ලොවට උතුම් සිරිපා මුනිඳුන් නේ
එබූ රුවන් පතුලකි කොත මුදු නේ
නිබඳම මල් ගෙන පිදුවෙමි එත නේ
සුර සුර මුදුනෙන් ආවෙමු මෙත නේ

31. එබස් අසා වැදි සිත් සන්තෝ සේ
නිබඳම මල් ගෙන යවු හැම දව සේ
යන්නට කීවොත් මගතොට එම සේ
මමත් එමැයි කිවු එලිවුනු දව සේ

32. එ තො ත් නුඹට අපි ලකුණක් කිය මි
ම ගි න් මගට මල් එක දෙක දම මි
යො දු න් ගණන් අපි වන පසු කර මි
මෙ ම ල් නෙලා ගොස් විමනේ වැසෙ මි

33. සමනල යන්නට උගෙ සිත පිරි යා
කන්නට කැවිලිත් ඉන බැඳ ගති යා
කන්‍යා ලිය කී ලකුණුත් දුටි යා
දන්නා ලෙස ගොස් සමනල දුටි යා

34. උසත් බලා සිට කොත පිට මුදු නේ
දෙහොත් මුදුන බැඳ ඉස්වට පා නේ
දැහැත් කපුරු මල් පහන් පුදන් නේ
පහත් වෙලා වැඳ බැස යති ඉති නේ

35. ආපසු එන්ඩත් මග දැන වැඳ ප්‍රී
සීතව හිමයේ මන් පසු කර ප්‍රී
වාත අඳුරු ඇර ළඹ එලි බැස ප්‍රී
සමනල විස්තර ලොව පවසා ප්‍රී

36. ස්වස්තික දෙක පිහිටපු සිරි පතුලේ
සිරිවස දෙක පිහිටපු සිරි පතුලේ
නඳවට දෙක පිහිටපු සිරි පතුලේ
අපි යමු වඳිනට ඒ සිරි පතුලේ

37. සෝ වැති දෙක පිහිටපු පතුලේ
අවතංසය දෙක පිහිටපු පතුලේ
වඞ්මාන දෙක පිහිටපු පතුලේ
අපි යමු වඳිනට ඒ සිරි පතුලේ

38. භද්‍ර පීඨ දෙක පිහිටපු පතුලේ
ප්‍රාසාදය දෙක පිහිටපු පතුලේ
තොරණ දෙකය පිහිටපු සිරි පතුලේ
අපි යමු වඳිනට ඒ සිරි පතුලේ

39. ශෙවත ඡත්‍ර දෙක පිහිටපු පතුලේ
ඛඩ්ග දෙකය පිහිටපු සිරි පතුලේ
තාල වෘත දෙක පිහිටපු පතුලේ
අපි යමු වඳිනට ඒ සිරි පතුලේ

40. මයුර හස්ත දෙක පිහිටපු පතුලේ
චාමර දෙක පිහිටපු සිරි පතුලේ
උණ්හීසය දෙක පිහිටපු පතුලේ
අපි යමු වඳිනට ඒ සිරි පතුලේ

41. මණී දෙකය පිහිටපු සිරි පතුලේ
සුමනදම දෙක පිහිටපු පතුලේ
නිලෝත්පල දෙක පිහිටපු පතුලේ
අපි යමු වඳිනට ඒ සිරි පතුලේ

42. රක්තෝත්පල දෙක පිහිටපු පතුලේ
රක්ත පද්ම දෙක පිහිටපු පතුලේ
සෙවතෝත්පල දෙක පිහිටපු පතුලේ
අපි යමු වඳිනට ඒ සිරි පතුලේ

43. සෙවත පද්ම දෙක පිහිටපු පතුලේ
පුන්කලසෂ දෙක පිහිටපු පතුලේ
පුර්ණ පාත්‍ර දෙක පිහිටපු පතුලේ
අපි යමු වඳිනට ඒ සිරි පතුලේ

44. සමුද්‍ර දෙක පිහිටපු සිරි පතුලේ
චක්‍රවාට දෙක පිහිටපු පතුලේ
හිමවත් දෙක පිහිටපු පතුලේ
අපි යමු වඳිනට ඒ සිරි පතුලේ

45. සූර්ය මඬල දෙක පිහිටපු පතුලේ
චන්ද්‍ර මඬල දෙක පිහිටපු පතුලේ
සතර වීප දෙක පිහිටපු පතුලේ
අපි යමු වඳිනට ඒ සිරි පතුලේ

46. සපරි වාර දෙක පිහිටපු පතුලේ
චක්‍ර වර්ති දෙක පිහිටපු පතුලේ
දක්ෂිණා ව්‍රත දෙක පිහිටපු පතුලේ
අපි යමු වඳිනට ඒ සිරි පතුලේ

47. සවර්ණ මත්ස දෙක පිහිටපු පතුලේ
චක්‍රායුධ දෙක පිහිටපු පතුලේ
සප්ත මහා දෙක පිහිටපු පතුලේ
අපි යමු වඳිනට ඒ සිරි පතුලේ

48. සක්සි දන්ත දෙක පිහිටපු පතුලේ
සප්ත ශෛල දෙක පිහිටපු පතුලේ
සප්ත තටා දෙක පිහිටපු පතුලේ
අපි යමු වඳිනට ඒ සිරි පතුලේ

49. සුපර්ණ රාජ දෙක පිහිටපු පතුලේ
සුංසුමාර දෙක පිහිටපු පතුලේ
ධජ දෙක පිහිටපු ඒ සිරි පතුලේ
අපි යමු වඳිනට ඒ සිරි පතුලේ

50. පතාක දෙක පිහිටපු සිරි පතුලේ
ස්වර්ණ ගිරී දෙක පිහිටපු පතුලේ
ස්වර්ණ ශිවක දෙක පිහිටපු පතුලේ
අපි යමු වඳිනට ඒ සිරි පතුලේ

51. ස්වර්ණ විජනි දෙක පිහිටපු පතුලේ
කෛලාශය දෙක පිහිටපු පතුලේ
සිංහ රාජ දෙක පිහිටපු පතුලේ
අපි යමු වඳිනට ඒ සිරි පතුලේ

52. ව්‍යාඝ්‍ර රාජ දෙක පිහිටපු පතුලේ
වලහක අසු දෙක පිහිටපු පතුලේ
උපෝහස්ති දෙක පිහිටපු පතුලේ
අපි යමු වඳිනට ඒ සිරි පතුලේ

53. වාසුකි නා දෙක පිහිටපු පතුලේ
හංස රාජ දෙක පිහිටපු පතුලේ
වෘෂභ රාජ දෙක පිහිටපු පතුලේ
අපි යමු වඳිනට ඒ සිරි පතුලේ

54. ඓරා හස්ති දෙක පිහිටපු පතුලේ
ස්වර්ණ මකර දෙක පිහිටපු පතුලේ
චතුර් මුඛය දෙක පිහිටපු පතුලේ
අපි යමු වඳිනට ඒ සිරි පතුලේ

55. වත්සක ධෙනු දෙක පිහිටපු පතුලේ
කිම් පුරුෂයෝ දෙක පිහිටපු පතුලේ
කින්නරාඞ්ග දෙක පිහිටපු පතුලේ
අපි යමු වඳිනට ඒ සිරි පතුලේ

56. කුරවික රාජ දෙක පිහිටපු පතුලේ
මයුර රාජ දෙක පිහිටපු පතුලේ
ක්‍රුවුච රාජ දෙක පිහිටපු පතුලේ
අපි යමු වඳිනට ඒ සිරි පතුලේ

57. චක්‍රවාට දෙක පිහිටපු පතුලේ
ජීවං ජීව දෙක පිහිටපු පතුලේ
ෂඞ්විධ ලෝ දෙක පිහිටපු පතුලේ
ෂොඩෂ ලෝ දෙක පිහිටපු පතුලේ

සාදු ! සාදු !! සාදු !!!

යනාදි දෙසිය සොලසක් මඞ්ගල්‍ය ලක්‍ෂණයෝ බුදුන්ගේ ශ්‍රී පාද පත්ලෙහි පිහිටා ඇත.

58. ඇසූ ඇසූ අය පින් ගෙන බල    වත්තු
ගෙන්ගෙට කියවා තෙල් සිඳ    ගත්තු
යන්නට සමනල මන් බැස    ගත්තු
ගොසින් මුනිඳු සිරිපා වැඳ    ගත්තු

59. වත පිරුවට ඇඳ පේවයි ය    න්නේ
අත පිරිසිදු කර පූජ කර    න්නේ
කොත පිට මලුවේ පන්සිල් ග    න්නේ
වැඳ පින් පුරවා නිවන් දකි    න්නේ

60. ඉන්ද්‍රනීල බුදු රැස් විහිදෙ    න්නේ
චන්ද්‍රමඬල සේ එළිය වැටෙ    න්නේ
ගින්ද්‍ර සේම ආ වසවතු පැ    න්නේ
නිවන් දකින්නට වදිමු ගොසි    න්නේ

61. වඳින්ඩ සමනල දෙවිඳු සිය    ල්ලේ
දිනන්ට සසරින් වදිමුව ගො    ල්ලේ
මල් පහනුත් ගෙණ වදිමු සිය    ල්ලේ
පාද පත්මෙ අපි වදිමුව ගො    ල්ලේ

62. එන මෙත්තේ බුදු මඟුලට එ    න්නේ
ජය ගත්තේ තුන් වරක් ගොසි    න්නේ
මේ වැත්තේ අපි සමනල එ    න්නේ
සමන් දෙවිඳු හට මේ පින් දෙ    න්නේ

63. ගොසින් වදිමු සිරිපා මුනිඳු    න්නේ
සමන් දෙවිඳු වෙද බාරව ඉ    න්නේ
සමන් දෙවිඳු මත්තට බුදු වෙ    න්නේ
පත්මෙ වඳින්නට පිහිට ලැබෙ    න්නේ

64. අරගන මුනිඳුගේ සරණ සිය    ල්ලා
මව්පිය ගුරුවර පා වැඳප    ල්ලා
නෑදෑ මිතුරන් සමගි වෙය    ල්ලා
තිසරණ පන්සිල් අටසිල් ග    ල්ලා

65. ව දි න් ඩ සමනල අපි යමු ගො    ල්ලේ
දි න න් ඩ සසරින් පසුව සිය    ල්ලේ
පු ද න් ඩ මල් පහනුත් එසිය    ල්ලේ
නිවන් ලබන්නට වදිමුව ගො    ල්ලේ

66. දෑත දෙපය අපෙ සව්කර දෙන    වා
උත්තම පාදේ වඳින්ඩ එන    වා
වරද සියලු අපෙ සමා කරන    වා
සමන් දෙවිඳුනේ එපින් ලබන    වා

67. සා දු සාදු මතු නිවන් දකි නවා
සා දු දිදී නරයෝ අපි එ නවා
සා දු දිදී ගිරිදඹේ නගි නවා
සා දු දිදී දෙවිඳුට පින් දෙ නවා

68. මෙලකට වැඩ අපෙ මුනිරජ එක ලේ
මේ සක්වල තැබී පතුල සමන ලේ
විසල් නුවර මුනි වැඩ සිට බෝමු ලේ
වඳිමුව අපි ගොස් පාද සමන ලේ

69. සාසන බාරවූ විෂ්ණු දෙවිය නේ
මේ හිම බාරවූ සමන් දෙවිය නේ
වරදක් තිබුණත් දුරලා හරි නේ
දෙවිඳුගෙ පිහිටෙන් හිමේ නගින් නේ

70. නඩේ මෙ යන සැම දෙන අහප ල්ලා
නඩේ ටිකෙන් ටික පසු නොබසි ල්ලා
තරහ තිබුනමුත් දුරුකර ග ල්ලා
ගුරුන් කියන සැම අහ පලය ල්ලා

71. සීත ගඟුලෙ අපි ගොස් නවති නවා
එතනදි සමහරු පඬුරු බඳි නවා
ගෙන ගිය බත් සැම කාලා ය නවා
සමන් දෙවිඳු අප හට පිහිට නවා

72. සීත ගඟුලෙදි පන්සිල් අරග න
උනුහුම් ඇති පිලි පමණක් ඇඳග න
සමන් දෙවිඳු හට පඬුරුත් බැඳග න
සාදු කියා යමු සතුටින් සැම දෙ න

73. ගෙත්තන් පානට ගොසින් බසි න්නේ
ගෙත්තන් කරලයි සමහරු ය න්නේ
ඉදිකටු නූළුත් සූරනට ග න්නේ
ගෙත්තන් කර දෙවිඳුට පින් දෙ න්නේ

74. දහමේ අනගුණ එහිදි කිය න්නේ
එතනදි සමහරු පන්සිල් ග න්නේ
සුගුණ සමන් දෙවි මේ පින් ග න්නේ
සාදු සාදු හිමෙ නගිමු කිය න්නේ

75. දර්ම රාජ ගල යසින් පෙනෙ න්නේ
බොහොම දෙනෙක් පඩි ගණන් කර න්නේ
ගණන කියන්නට බැරිලූ බොල න්නේ
කිමද කියා සමහරු ලත වෙ න්නේ

76. හැරම්ටි පානට ගොසින් බසි න්තේ
ගුරුන්ට අපි සැම පින් පෙත් දෙ න්තේ
පාද පත්මෙ ඇති මළුව පෙනෙ න්තේ
අත් දිගු කර සැම සාදු කිය න්තේ

77. හැරම්ටි පානය නම් පවසා ලා
දැහැත් කපුරු පුද ගෙනත් තියා ලා
පාද පත්මෙ අපි නලල තබා ලා
සමන් දෙවිඳු හට පින්දෙමු නුමු ලා

78. සමන් දෙවිඳුගෙන් පිහිට ලබ නවා
උතුන් බුදුන් අපි වදින්ට ය නවා
හැරම්ටි පානේ නැවතී ය නවා
එතනදි සමහරු පඬුරු බඳි නවා

79. රඹකැන් කැව්ලිද කෝපි ද බී මා
මදක් එතන ඉඳ වාඩිව සැවො මා
සාදු දිදී අපි පිටත්ව නොප මා
කුඩා එගිරිදඹ නගිමුව සැවො මා

80. ආඩිය මල තැන්නයයි කිය නවා
එතනට මලුවත් සොඳට පෙනෙ නවා
තෙල් මල් අරගෙන වදින්ට ය නවා
සමන් දෙවිඳු සැමටම පිහිට නවා

81. ඇහැල කතුව ලහ ගොස් නවති න්තේ
අටසිල් පන්සිල් අරගෙන ය න්තේ
සිතේ කුහක කත් අත් හැර ය න්තේ
සමන් දෙවිඳු අප හට පිහිට න්තේ

82. එතනින් මහගිරි දඹය නගි න්තේ
දන්වැල් අල්ලා ඉහළ නගි න්තේ
හුලන් කපල්ලෙන් ගැලවී ය න්තේ
සමන් දෙවිඳු සැමටම පිහිට න්තේ

83. වට පිට නොබලා පාර බල න්තේ
අඩියෙන් අඩියට සාදු කිය න්තේ
දන්වැලෙ එල්ලී දඹය නගි න්තේ
සමන් දෙවිඳුනේ අපි රැක දෙ න්තේ

84. සියලු දෙනම ගොස් පද්මෙ වදි න්තේ
මාර යුදෙන් ජයගත්තා වැ න්තේ
පුද පූජාකර පින් ලැබ ග න්තේ
සුමන සමන් දෙවි මේ පින් ග න්තේ

85. දැ ක ලා මුනිරජ පැන් ගෙන ය න්නේ
නොතලා පලවැල මුනිඳුට දු න්නේ
ප ත ලා ගිරි කුළු කඳු එලි ව න්නේ
කොතලා බැබිලේ හෙල පසු ව න්නේ

86. දු කි නා කිසි කලෙකත් නොදකි න්ඩයි
ර කි නා පන්සිල් පේවී ඉ න්ඩයි
ව කි නා පුන්සඳ සේ මෝ්ර න්ඩයි
ද කි නා මළුවට ගොසින් බසි න්ඩයි

87. ඉ ඩ න් කරන ලෙස බිම් තනවා ලා
දෙ ඩ න් ගසක ගෙඩි දැක නෙලවා ලා
දෙ ඩ න් නුමුත් ගෙන්නා වළඳ ලා
දෙ ඩ න් බැබිලෙ හෙල පසු කර වැඩ ලා

88. ප ලා දෙලී ගඟ එගොඩට වැඩි මු නී
ව ලා කුළුත් ඇර ගමතොට එලි උ නී
බ ලා පිපෙන මල් වට හැම විහිදු නී
බ ලා පවන් පිට වඩිනා අපෙ මු නී

89. නි ලී හෙලේ ඔද වැඩ නික්මෙ න්නේ
නි ලී හෙලේ වැඩ දඩ අස්ව න්නේ
නි ලී හෙලේ වැඩ ගොනටු තන න්නේ
නි ලී ව ඇවිදින් බුදුන් දකි න්නේ

90. ගි ලී නාද සොඳ සිසිලෙස ඇ ල්ලේ
වෙ ලී පුවක් මල් තැඹිලිද ව ල්ලේ
තැ ලී තිබෙන මල් පිපිලා ගො ල්ලේ
ගි ලී මලේ වැඩ සිට සෙවනැ ල්ලේ

91. බු ඩ ර ත් නය දැගසව්වන් අනඳ මහතෙරුවන් බ ලේ
ධ ම් ර ත් නය මුනිඳු වදහල සතුන් ගොඩලනමොක්ප ලේ
ස ං ඝ ර ත් නය උපාසකවරු දන් දීදී ලොව වැඩ ක ලේ
මෙතුන් ර ත් නය තබා සිරසේ වඳින් සිරිපා සමන ලේ

92. ද ව ස් සත මිස වඩා දවසක් නැතුව තිස්සෙම එක්ක ලේ
ද ව ස් සතියේ පෝය පේවී රකින පන්සිල් අටසි ලේ
ද ව ස් තුන්සිය සැටක් ගිය තැන දෙලොස් මස අවුරුදුකලේ
වෙසක් මස පසළොස්වකින් ගොස් වඳින් ශ්‍රීපා සමන ලේ

93. එ ස ක් පුර සිට සකස්පුරවා දෙපස් රන් පෙත්තක් දි ලේ
එ ස ක් දෙවුපුර කරන පූජා මිසක් වෙන නැත සක්ව ලේ
මෙ ස ක් වල හැම වෙලඳ ගොවි කුල සිටුසතෙක් වැද පින්කලේ
වෙ ස ක් මස මහ නැඟි දෙපෝද වඳින් ශ්‍රීපා සමන ලේ

94. වි සේ සව මහ ඉසුරු සැපතින් ඉපිද අපෙ මුනිපෙරක ලේ
තො සේ වඩිනා පසේමුනි දැක දෙන්ඩ රසදැන් සිතු ලො ලේ
ල සේ වසවතු මැවූ ගිනිමැල මැදින් ගොස් දන්දුන් ක ලේ
මෙ සේ තෙද බල පැපු මුනිරජ වදින් ශ්‍රීපා සමන ලේ

95. පාවසන රට නොගොස් මහමෙරහිදී සෙනහක් නැති ක ලේ
බෝව පෑ තෙද නොදැක සතියක් වැටී පීනා මහ ජ ලේ
සිහිව මන්ත්‍රී මෙහෙකලා දෙවි දැකම උයනේ පන්ස ලේ
පෙනුනාසේ බෝසතාණන් වදින් සිරිපා සමන ලේ

96. තමා කගයෙන් කපා දුන් ඉස් මෙරට සරිකොට පල ක ලේ
පැහැද තම සිත උරිරු දුන් කල මුහුදුජල පැරදුනු ක ලේ
නොහැර දස පෙරුමන්ගෙ බලයෙන් බුදුව වැඩඉඳ බෝ මු ලේ
පැහැද තුන්සිත දපා සිරසේ වදින් සිරිපා සමන ලේ

97. මෙඅප නොදකින බණ කියන්නට බැරිය සුදනෙනි ගත් පලේ
රුවන් කොන්දක ඇමුනුවාසේ රත්නයෙන් සැදි නිකස ලේ
නුවන් පුරවා අසන් සැමදෙන සමනලට කී බණනි ලේ
නිවන් පුර සිරි පහා වැන්දෙන් එබුදු සිරිපා සමන ලේ

98. පාට තද තෙද ඉරසදෙක්මය සෑම සක්වල ගිනිජ ලේ
හුත වැසි වැස යොදුන්වට පොද අහස උඩගිය මොක්ප ලේ
වාත සුලඟින් දසදහස් මෙර අහස ගිනිජලයට කෙ ලේ
ඊට මැතින් නිවන් දැක්මට වදින් සිරිපා සමන ලේ

99. ද ඹු ල් ලේ අස්නක් කලේ මුනිරජුන් වැඩඋන් පෙර ක ලේ
මෙර තුලේ සක්මන් කලේ රජ වප් මඟුල් පූජා ක ලේ
ඉරු බෙලේ දැපනේ කලේ මුනි දහම් වැඩහිඳ බෝමු ලේ
අබ තුලේ සක්මන් කලේ තෙද වදින් සිරිපා සමන ලේ

100. යසෝදර නම් බිසෝ රාහුල කුමරිඳුන් ලත් පෙර ක ලේ
තොසේ වඩවා කුමරු දකිනට වැඩිය පියරජ ගැබ තු ලේ
සිතේ සෙනෙහස වඩා රසකිරි පොවනද මෙය ගැබ තු ලේ
ලසේ එවිගස රැගත් සිරිපා වදින් බැතියෙන් සමන ලේ

101. මෙ රේ උසටත් වඩා බිසවුන් කුමරුවන් බැඳ දුන් වැ ලේ
ක රේ ඇහමස් ලියා දුන්කල දෙරණ උපමා වැඩ ක ලේ
තු රේ හිමිරජ ලෙසින් දුන්නෙන් අහසතරුමදි බෝ ක ලේ
නි රේ එක්සිය සතිස් දුරලා වදින් ශ්‍රීපා සමන ලේ

102. මෙ රේ දසදහසක් ගණන් ඇති වක්‍ර සෙනගක් වැඩ කලේ
න ලේ එකවිට පිඹී සක ගිය විහිද දස දහසක් ව ලේ
ක ලේ මුනිබණ දේසනාවෙන් සතුන් ගොඩලන මොක් ප ලේ
ග ලේ මුනිරජ එබු ශ්‍රීපා වදින් බැතියෙන්. සමන ලේ

103. ද හ මි සොඬරජ වස්තු තරමට සෙනඟ හට දී පින්බ ලේ
වි සු මි බලමැයි ඇවිත් සක්රජ දනක් දෙන්නට කී ක ලේ
ද හ මි කියතොත් දෙමැයි මෙර උස්පමණ විවරට ගිනි ජ ලේ
ම සි න් දන් දී පැතූ බුදුබව වඳින් සිරිපා සමන ලේ

104. ම හ ත් ගරු අය වන්දනාවේ යන්ට යමු කී සමන ලේ
ර හ ත් ගණනක් උපාසක වරු පන්දමුත් අවුලා ග ලේ
ද හ ස් ගණනක් විවර පිරිවර පහන් තෙල් රෙදි සරික ලේ
අ හ ස් ගර්ජන ලෙසට පූජා වඳින් සිරිපා සමන ලේ

105. ක න් තක අශ්වයා මුදමින් ගෙනත් මුනිඳුට ලං ක ලේ
ඉ න් දවා තුන්දෙනා යන ලෙස ගොසින් පහුරට එක් ක ලේ
කැ න් දවා දන් දීපු මහිමෙන් ඇරීගිය දෙර පින් බ ලේ
වි න් දවා සිරි සැපත් දෙවුලෝ වඳින් සිරිපා සමන ලේ

106. තු සි ත පුරයෙන් දේවතාවෝ දෙපසෙ පන්දම් පැ නි ලේ
බ සි ත එලියට සදෙව් ලොව දෙව් අහස සිටිනා නිකස ලේ
දෙසි ත නොව සිත අසුවසන්කොට පැනපු පිම්මකි වැලිතලේ
ම සි ත පාද වඳින් මුනිරජ එබූ සිරිපා සමන ලේ

107. ම සු රු නොව සිත කේසදතුව කපා අහසට දැමූ නි ලේ
ඇ සු රු සැනෙකින් සිවුරු පිරිකර ගෙනත් මහබඹු දික් ක ලේ
රු සි රු ඇඳි සලු අහස දමමින් බලා මුනිඳුගෙ පින් බ ලේ
ල හි රු මඬලක් ලෙසින් ගිරිහිස දරා තුන්සිත රන් දි ලේ

108. එ යි න් මහ සිවුවරන් ගෙන්නා නරනිඳුන් කරුණා ක ලේ
කෙලි න් සුරහට දෙමින් රත්තරන් දෙරන කරවා සමන ලේ
පැ යි න් මුනිඳුගෙ මහවිහාරය ජේතවන රාමය ක ලේ
පි යු න් සොලසක් දෙසිය ලක්ෂණ වඳින් සිරිපා සමන ලේ

109. බෝකලේ පින්කම් කනේ බස් මුදව හැම දෙන පින් බ ලේ
ගනකලේ මෙරමුදුනතින් වැඳ මුනිඳු වැඳ සිරිපා මු ලේ
තිලෝ සතහට පෙනී ගොස් දෙව් බඹුන්ටත් ඒ සක්ව ලේ
ගලේ සැට කෝටියක් සිරිපා වඳින් බැතියෙන් සමන ලේ

110. දැ ඩි ව වැඩ උන් වජ්‍රාසනය ගන්ඩ වසවතු යුදක ලේ
ක ඩු ව කොනගෙන යුද කරන්නට දසදෙනකු ඇතිකලබ ලේ
අ ඩු ව නොකරන ලෙසට දසබිම්බරක් බිඳහැර සක්ව ලේ
අ ඩි ය තර කළ මුනිරජානන් වඳිම් සිරිපා සමන ලේ

111. ද ළු ත් ලියලා මුළුත් කඳවට අතුත් සැදි මල් පුල්වි ලේ
ගළු ත් කඳු සෙල් බෙර ඇසක්සේ දෙරන කරවා සමන ලේ
කළු ත් රතු සුදු නිළුත් බුදුරැස් විහිද යෙයි හැම සක්ව ලේ
ඉරු ත් දින දින කරනසේ ඒ වඳින් සිරිපා සමන ලේ

112. තානයෙන් එක් සුබස් මිහිකොට රකින පන්සිල් අටසි ලේ
වී න යෙ න් අසු කුඩලය දැක මතුට වෙද දැපනෝ ක ලේ
පාන යෙ න් එන වාත වෙන වෙන සතුට වස්තුව දුන් ක ලේ
සීල ගු ණ පෑ මුනිරජාණන් වඳින් සිරිපා සමන ලේ

113. සාදු මෙකල කුසල් බලෙන් සද්ධර්මය පහල වෙ න්ඩ
සක්විති රජ පියන් ලබා ගුවන් සක්මනේ වඩි න්ඩ
පුන්සඳසේ ලද බිසවුන් කලපුරුදුව වෙන් නොව න්ඩ
සුද්ද වන්ස උතුන් කුලෙන් සොඳ කුලයක පිළිසිඳෙ න්ඩ

114. සත් බඹයක් මගෙ වරලස මොණර පිලසෙ වර්ණ ව න්ඩ
සත් ගවුවක් මගෙ කටහඬ කිඳුරු නාද මෙන් ඇසෙ න්ඩ
බිහිඋනාම මගේ රුවෙන් තුන් ලොවටම එලිය වෙ න්ඩ
රන් පන්හිඳ ගෙන සුරතින් බුදුගුණ රන් පොත ලිය න්ඩ

115. ග තේ රෝග කිසි කලක නොව න්ඩයි
ඇ තේ කියන කුලයක උපදි න්ඩයි
සි තේ මුනිඳු බණ තොර නොකර න්ඩයි
මෙ තේ මුනිඳු දැක නිවන් දකි න්ඩයි

116. රෝග ව්‍යාදි දුක් කලක නොව න්ඩයි
වයස ගියත් කය මහලු නොව න්ඩයි
සියැසේ දුටු අය සිත් ලොබ ව න්ඩයි
සැම කල් ඉසකේ නර නොපැසෙ න්ඩයි

117. උදයට පායන ඉරු දෙවිය න්ඩයි
සවසට පායන සඳ දෙවිය න්ඩයි
මාගේ ගුරුවර දෙමව් පිය න්ඩයි
සතර වරන් දෙවි මේ පින් ග න්ඩයි

118. එන මෙත්තේ බුදු මගුලට එ න්ඩයි
බෝදි තුනෙන් එකකට පැමිණෙ න්ඩයි
මෙතේ බුදුන් දැක නිවන් දකි න්ඩයි
සමන දෙවියනේ මේ පින් ග න්ඩයි

119. සක්වල දෙවියෝ දිවස් බල න්ඩයි
දෑත දෙපය අපෙ සවිකර දෙ න්ඩයි
සදෙව් ලොවේ දෙවි මේ පින් ග න්ඩයි
මේ පින් බලයෙන් නිවන් දකි න්ඩයි

120. මේ ස න් සාරෙන් එතරව ය න්ඩයි
බෝ ස න් තෝසෙන් පින්කර ග න්ඩයි
පා පෙ න් වැලකී කුසල් කර න්ඩයි
වා තු න් මහරාජික උපදි න්ඩයි

121. දෙ සි ත නොවි දන් පින්කර ග න්ඩයි
සි රි ත විලස යදිහට දන් දෙ න්ඩයි
නි ය ත මුනිඳු දෙසූ දහම් අස න්ඩයි
තු සි ත පුරේ දිව සැප විඳ ග න්ඩයි

122. සි රි ම ත් දඹදිව මතු උපදි න්ඩයි
පැහැ ප ත් කුලයක මම උපදි න්ඩයි
ගුණ යු ත් සිරිපා වැඳ පින් ග න්ඩයි
මිහි ක ත් දෙවියනි නිවන් දකි න්ඩයි

123. ම හා දනය ලැබගත උපදි න්ඩයි
ම හා සඟුන් හට නිති දන් දෙ න්ඩයි
ම හා ගුණෙන් යදිහට දන් දෙ න්ඩයි
ම හා විස්නු දෙවි නිවන් දකි න්ඩයි


124. ඈ ත පටන් පින් දහම් කර න්ඩයි
පා ත ට බසිනා පව් නොකර න්ඩයි
ප්‍රේ ත නගා තිසරණ ලැබ ග න්ඩයි
නා ත දෙවිඳු ඔබ නිවන් දකි න්ඩයි

125. සා දු සා දු මගෙ ගුරුවරයි න්ඩයි.
සා දු සා දු මගෙ දෙමවුපිය න්ඩයි
සා දු සා දු මගෙ දූ දරුව න්ඩයි
සා දු සා දු මම නිවන් දකි න්ඩයි

126. සා දු සසුන සිරිලක බැබලේවා
සා දු දහම් දින දින පැතිරේවා
සා දු සිහල දනහට ජයවේවා
සා දු නිවන් අප සැමට ලැබේවා.

## සිද්ධිරස්තු

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු